**හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව - 2022**

**---------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | LDSP ව්‍යාපෘතිය යටතේ සාදා නිම කළ රු.4,856,034 ක් වටිනා මාර්ග ඉදිකිරීම් වටිනාකම ගිණුම් ගතකර නොතිබුණි. | ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | ස්ථාවර වත්කම් වල අගය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | LDSP ව්‍යාපෘතිය යටතේ මිලට ගන්නා ලද රු.2,303,000 ක් වටිනා සෝලා වීථි පහන් කට්ටල 49 ක් සමාලෝචිත වර්ෂයේ වත්කම්වලට ඇතුළත් කර නොතිබුණි. | ජ'නල් සටහන් මගින් ගිණුම්ගත කළ බව. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී මිළට ගන්නා ලද රු.149,250 ක තණකොළ කපන යන්ත්‍ර 05 ක් සහ ඇම්පියර් 120 බැටරි 04 ක් ඇතුළු අයිතම 22 කට අයත් රු.624,525 ක් පිරිවැය වූ උපකරණ අදාළ තොගය යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම්ගත කිරීමට කටයුතු කළ බව. | -එම- |
| (ඈ) | ප්‍රාදේශීය සභා අරමුදල් සහ වෙනත් රාජ්‍ය ප්‍රතිපාදන මත සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිකර තිබූ රු.22,276,087 ක් වටිනාකම වූ මං මාවත්, පාලම් හා බෝක්කු හා රු.7,505,942 ක ගොඩනැගිලි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.765,500 ක හියුම් පයිප්ප තොගයේ වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා නොතිබුණි. | -එම- | -එම- |
| (ඊ) | LDSP අරමුදලින් මිලටගන්නා ලද රු.102,875 ක් වටිනා පාරිභෝජ්‍ය ද්‍රව්‍ය තොග වලට ඇතුළත් කර නොතිබුණි. | ජ'නල් සටහන් මගින් ගිණුම්ගත කිරීමට කටයුතු කළ බව. | -එම- |
| (උ) | පිබිදෙමු පොළොන්නරුව ව්‍යාපෘතිය යටතේ වැඩ නිම කර සභාවට භාරදෙනු ලැබූ තාරුකා මණ්ඩපයේ වටිනාකම ගිණුම්ගත කිරීමේදී රු.1,000,000 ක් වටිනා වැසිකිළි පද්ධතිය ඉදිකිරීම් පිරිවැය ඇතුළත් කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයකරගත යුතුව තිබූ රු.289,670 ක් වටිනා වත්කම් බදුදීම්, ආදායමට හඳුනාගෙන ගිණුම් ගත කර නොතිබුණි. | -එම- | ආදායම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කළ යුතුය. |
| (එ) | යන්ත්‍ර සූත්‍ර කුලියට දීමේ ලේඛන අනුව හිඟව පවතින රු.325,080 ක හිඟ ආදායම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. | රු.325,080 ගිණුම්ගත කළ බව. | ගිණුම් නිවැරදිව ඉදිරිපත් කිරීම සඳහා කටයුතු කළ යුතුය. |
| (ඒ) | පළාත් පාලන කොමසාරිස් විසින් 2019 දෙසැම්බර් 31 දින නිකුත් කරන ලද චක්‍රලේඛ අංක 2019/02 අනුව දක්වා ඇති ක්ෂය අනුපාතයන්ට වත්කම් ක්ෂය නොකිරීමෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය රු.90,636 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි අනුපාත අනුව ක්ෂය ගණනය කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඔ) | 2020 ජූනි 11 දින ලදුපත් අංක 621 මගින් තැන්පත් කර තිබූ රු.64,843 ක කර්මාන්ත තැන්පතුවක් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි. | මගහැරුණු තැන්පතු වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ බව. | -එම- |
| (ඕ) | සමාලෝචිත වර්ෂයට අදාළ රු.3,316,494 ක ගෙවිය යුතු විවිධ ණයහිමි වටිනාකමක් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. | ජ'නල් සටහන් මගින් ගිණුම්ගත කළ බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ක) | සභාව විසින් උපයා ගත් ආදායමින් ආපසු ගෙවා තිබූ රු.247,785 ක ගෙවීම් හුවමාරු ගනුදෙනුවලින් ලැබිය යුතු වත්කම් ලෙස දක්වා තිබුණි. | නිවැරදි කරන ලද බව. | -එම- |
| (ග) | ප්‍රාදේශීය සභාව විසින් හිඟුරක්ගොඩ මහේස්ත්‍රාත් අධිකරණ භූමියේ ඉදිකරන ලද නීතිඥ කාර්යාල පරිශ්‍රයට අදාල ඉඩමේ ඉදිකර තිබූ කඩ කාමර 16 ක් සඳහා අයකර ගත යුතුව තිබූ ටෙන්ඩර් ගාස්තුව වන රු.3,465,325 ක් හා මාසිකව අයකරගත යුතු කුලී මුදල් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ච) | ප්‍රාදේශීය සභාවට අයත් ගොඩනැගිල්ලක් ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයට ලබා දීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු කුලී ආදායම රු.730,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ජ) | නිල නිවාස කුලී ආදායම රු.240,900 ක් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණු අතර, ඊට අදාළ හිඟ ආදායම් රු. 34,600 ක් ජංගම වත්කම් යටතේ දක්වා නොතිබුණි. | ජ'නල් සටහන් මගින් නිවැරදි කර ඇති බව. | -එම- |
| (ට) | හිඟ හිටි මළ අපවහන ගාස්තු ගිණුම් තැබීමේදී රු.31,300 ක් වූ ඉදිරියට ලද මළ අපවහන ගාස්තුව වර්ෂයේ ආදායමට හිලව් කර තිබුණි. | -එම- | -එම- |
| (ඩ) | රජයේ හා විවිධ ආයතනවලින් ලැබෙන ප්‍රාග්ධන වියදම් ප්‍රදාන එකවර ආදායමට හඳුනානොගෙන ක්ෂය කිරීම් ගණනය කළ පදනම මත විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට සටහන් අංක 5 යටතේ දැක්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාග්ධන වියදම් ප්‍රදාන ලෙස ලද රු.37,444,096 ක මුළු වටිනාකම ආදායම් ලෙස හඳුනාගෙන තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |

### 1.6.2 නොසැසඳුණු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උපයෝගී ලේඛන හා මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ගෙවිය යුතු බැරකම් අතර රු.3,815,003 ක නොසැසඳීමක් විය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන හා උපලේඛන අතර සැසඳීම් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ලැබිය යුතු ආදායම් ශේෂය හා ලැබිය යුතු ආදායම් ලේඛනය අතර රු.1,784,692 ක නොසැසඳීමක් විය. | -එම- | -එම- |
| (ඇ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබූ ලැබිය යුතු දෑ වැඩිවීම සහ වෙනත් ජංගම වගකීම් වැඩිවීම යන අගයන් ගිණුම්කරණ සටහන් අනුව ඉදිරිපත් කර තිබූ අගයන් අතර රු.6,959,425 ක නොසැසඳීම් විය. | -එම- | -එම- |

### 1.6.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.60,180,574 ක් වටිනා ගිණුම් ශේෂ 02 ක් ශේෂ සනාථ කිරීම්, කාල විශ්ලේෂණ සහ යාවත්කාලීන කරන ලද ලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | ලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන පනතේ විධිවිධාන දක්වමින් පළකර | | | |

| | | | |
|---|---|---|---|
| තිබූ 2235/54 හා 2021 ජූලි 08 දිනැති ගැසට් පත්‍රය | | | |
| VI කොටසේ 83(1) වගන්තිය | 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වාණිජ ගොඩනැගිලි සඳහා ගොඩනැගිලි සැලසුම් අනුමත කර සංවර්ධන බලපත්‍රය ලබාගෙන තිබුණද, පුද්ගලයින් 51 දෙනෙකු විසින් අනුකූලතා සහතිකය ලබාගෙන නොතිබුණි. | අනුකූලතා සහතික ලබාගන්නා ලෙසට ලිපි ඉදිරිපත් කරනු ලැබූ නමුත් ප්‍රතිචාර දක්වා නොමැති බව. | පනත අනුව කටයුතු කිරීම සඳහා යොමු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අයහාරය ඉක්ම වූ වියදම රු.42,743,575 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ අයහාරය රු.8,106,562 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 9,854,319 | 10,793,144 | 10,115,549 | 2,850,403 | 9,253,005 | 8,043,777 | 9,325,820 | 2,172,808 |
| (ii) | කුලී | 37,687,276 | 23,010,550 | 17,635,820 | 12,846,296 | 22,024,338 | 17,109,358 | 17,718,960 | 7,471,506 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 3,198,750 | 1,853,443 | 1,115,219 | 1,153,783 | 3,097,750 | 2,472,050 | 2,115,650 | 415,559 |
| (iv) | වෙනත් ආදායම් | 32,443,944 | 43,938,970 | 30,985,518 | 12,190,619 | 32,314,474 | 50,206,655 | 52,966,030 | (762,833) |
| | | 83,184,289 | 79,596,107 | 59,852,106 | 29,041,101 | 66,689,567 | 77,831,840 | 82,126,460 | 9,297,040 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| (i) | 2022 වර්ෂයේ හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව සතු වරිපනම් අයකරනු ලබන දේපල සංඛ්‍යාව 5968 ක් වූ අතර, එයින් දේපල 2661 ක වරිපනම් හිඟව පැවතුණි. | වරිපනම් සීමා ගැසට් කර නොමැති බැවින් දේපල තහනමට ගැනීමට නොහැකිව ඇති බව. | වරිපනම් බල ප්‍රදේශ ගැසට් කිරීම සඳහා නොපමාව කටයුතු කළ යුතුය. |
| (ii) | 2020 සහ 2021 වර්ෂ වලට අදාළ කර්මාන්ත බදු රු.144,620 ක් ද, ව්‍යාපාර බදු රු. 265,495 ක මුදලක්ද, අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ අයකර ගැනීම සඳහා අවසන් නිවේදන ලිපි යවා ඇති අතර, රු.77,310 ක් අයකර ඇති බව හා නීතිමය කටයුතු කිරීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකළ යුතුය. |
| **(ආ)** | **කුලී** | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විට සභාවට අයත් කඩ කාමර 194 කින් රු.7,187,119 ක් වූ හිඟ ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ කුලී කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකළ යුතුය. |
| (ii) | 2022 දෙසැම්බර් 31 දිනට 2016 සිට මේ දක්වා ලැබිය යුතු යන්ත්‍ර කුලී ආදායම රු.6,825,440 ක් වූ අතර ඉන් රු.443,677 ක් සභාවේ මන්ත්‍රීවරුන්ට කුලී පදනම මත යන්ත්‍ර සූත්‍ර ලබාදීමෙන් අයකරගත යුතු ආදායමක් විය. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකරගත යුතුය. |
| (iii) | පිබිදෙමු පොළොන්නරුව ව්‍යාපෘතිය, 2021 වර්ෂයේදී නිම කර ඇති නමුත් එම ව්‍යාපෘති කටයුතු සඳහා යන්ත්‍ර කුලියට ලබාදීම වෙනුවෙන් සභාවට අයවිය යුතු මුදල රු.2,041,448 ක් විය. | හිඟ මුදල් අයකරගැනීමට විස්තර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදී ඇති බව. | පසුවිපරම් කටයුතු සිදුකළ යුතුය. |
| **(ඇ)** | **වෙනත් ආදායම්** | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තු වටිනාකම් අනුව ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.11,474,589 ක් විය. | මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් ගෙන්වා ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය** | | |
| 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 95 වගන්තිය ප්‍රකාරව කසල, මළ හෝ එවැනි ද්‍රව්‍ය, පීඩාවක් සිදුවන අන්දමින් බැහැර නොකෙරෙන බවට වග බලාගැනීමට අවශ්‍ය සියලුම වැඩ පිළිවෙල සහ පූර්වාරක්ෂක විධිවිධාන සැලැස්විය යුතු වුවද, සභාව විසින් ඉවතලන ද්‍රව්‍ය බටුඔය රත්මලේ ප්‍රදේශයේ ස්ථානයකට බැහැර කිරීමේදී ඒ පිළිබඳ අවධානය යොමුකර නොතිබුණි. | දිරන කසල ලංකාපුර කාබනික පොහොර නිෂ්පාදන අංගනය වෙතද, නොදිරන කසල ගබඩාව තුළද රැස්කරන බව. | පරිසර හිතකාමී ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය. |

### 3.2 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| LDSP ප්‍රතිපාදන යටතේ 2022 මාර්තු 16 දින රු.2,303,000 ක් වැයකර සෝලා වීථි ලාම්පු 49 ක් මිලටගෙන ප්‍රාදේශීය සභිකයින්ගේ ඉල්ලීම් මත අදාල කොට්ඨාශයන්හි සවිකර තිබුණද, ඒවායේ ආරක්ෂාව සඳහා සුදුසු ක්‍රමවේද අනුගමනය කර නොතිබීම හේතුවෙන් රු.846,000 ක් වූ වීථි ලාම්පු 18 ක් අස්ථානගත වී ඇති බව සෝදිසි පරික්ෂාවේදී නිරීක්ෂණය විය. | ඉල්ලීම් හා අවශ්‍යතා අනුව සෝලා ලාම්පු සවිකළ නමුත්, ඒවායේ ආරක්ෂාව ලබාදීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති බව. | වීථි ලාම්පුවල ආරක්ෂාව සඳහා වැඩපිළිවෙලක් සකස් කරවාගැනීම හා මු.රෙ. ප්‍රකාරව හානි සම්බන්ධව කටයුතු කළ යුතුය. |

### 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නිලධාරීන් දෙදෙනෙකුට 2022 වර්ෂයේද, එක් නිලධාරියෙකුට 2010 වර්ෂයේද ලබාදුන් රු.556,520 ක් වටිනා ආපදා ණය මුදල ලබාදුන් දිනයේ සිට අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | 2023 මාර්තු සිට ණය හා පොළී මුදල් අයකර ගැනීමට කටයුතු කර ඇති බව. | පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රමවේද නිවැරදි කර ගැනීමටත් නොසැලකිල්ලක් හෝ විෂමාචාරයක් සිදුවී තිබේ නම් ඒ සඳහා කටයුතු කිරීමත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කිරීමට යොමු වූ 2020 වර්ෂයේ සංක්‍රාන්ති ගිණුම සමඟ වත්කම් 08 ක් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | අදාළ වත්කම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.මිලියන 27.15 ක් වැය කර පිබිදෙමු පොළොන්නරුව ව්‍යාපෘතිය යටතේ 2019 වර්ෂයේ ඉදිකර නිම කර ප්‍රාදේශීය සභා වෙත භාරදුන් කඩ කාමර 92 කින් සමන්විත හිඟුරක්ගොඩ නව පොදු වෙළඳපොළ විගණිත දිනවන විටත් කඩ කාමර කුලියට දීමකින් තොරව වර්ෂ 03 කට ආසන්න කාලයක් නිශ්කාර්යව පැවති අතර, ඒ මඟින් සභාවට තක්සේරු කුලිය මත සමාලෝචිත වර්ෂයට අදාළව පමණක් අහිමි වූ ආදායම රු.12,631,600 ක් විය. | නඩු කටයුත්තක් හේතුවෙන් කඩ බෙදාදීම අත්හිටුවා ඇති බව. | නීතිමය උපදෙස් ලබාගෙන අප්‍රමාදව වත්කම් උපයෝජනයට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව සතු ජල යෝජනා ක්‍රම 05 හි ජල මූලාශ්‍ර වල ජලය පිරිපහදු කිරීමක් සිදුනොකරන අතර එක් සාම්පල් පරීක්ෂාවක් 2022 අප්‍රේල් 26 දින ජාතික ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය මඟින් සිදුකරගෙන තිබුණද, එම ජලය පානය සඳහා සුදුසුද යන්න පිළිබඳ නිර්දේශයන් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | ජල සාම්පල් පරීක්ෂාවක් සිදුකිරීමට කඩිනමින් කටයුතු කරන බව. | ජලය පරීක්ෂා කර තත්වය පිළිබඳ පාරිභෝගකයින් දැනුවත් කළ යුතු අතර තත්වය ඉහළ නංවා ගැනීමට කටයුතු කළ යුතුය. |